# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்


පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් தொலை நகல் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (தொலை நகல்) 2868450

මැතිවරණ මහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය: PE/10/24
எனது இல:
ඔබේ අංකය :
உமது இல:
දිනය : 2010.02.15

<u>**චක්‍රලේඛ අංක TR/02(01)**</u>

**ඉතා වැදගත්ය. හදිසියි.**

**සියළුම අමාත්‍යාංශ / ලේකම්වරු,**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන් සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන් වෙත,**

<u>**පාර්ලිමේන්තු මැතිවරණය - 2010**</u>
<u>**රජයේ වාහන ලබාදීම.**</u>

**ඉදිරියේදී පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේදී ඡන්ද පොළ වලට හා ඒවායේ සිට නිලධාරීන් , උපකරණ, ලිපිද්‍රව්‍ය ආදිය ප්‍රවාහනය කිරීම සඳහා දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන්ට (කාර්, ජීප්, ස්ටේෂන් වැගන්, වෑන්, ඩබල් කැබ්,කෲ කැබ්, බස්) ආදී වශයෙන් මෝටර් රථ වාහන විශාල සංඛ්‍යාවක් අවශ්‍ය වේ. එබැවින් මනා ධාවන තත්වයෙන් යුත් හැකි සෑම මෝටර් වාහනයක්ම ඉහත සඳහන් ඡන්ද විමසීමේදී පාවිච්චි කිරීම සඳහා යොදාගැනීම පිණිස මා වෙත ලබාදෙන ලෙස සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන්, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි සභාපතිවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.**

02. **ඔබේ අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව, ආයතනය සතුව ඇති මනා ධාවන තත්වයකින් යුත් සියළුම වාහන පිළිබඳ විස්තර පසුගිය ජනාධිපතිවරණයට අදාළව දැනටමත් අදාල දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරී / දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී තිබෙන බැවින් එම සංගණන වාර්තාවම පදනම් කරගනිමින් මෙම ඡන්ද විමසීම සඳහා ද වාහන කැඳවනු ලබන බව කාරුණිකව දන්වමි.**

03. **තවද අමාත්‍යාංශ ලේකම්වරුන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ සංස්ථාවන්හි සභාපතිවරුන් සහ ස්ථානාධිපතිවරුන් යන නිලධාරීන්ට එක් වාහනයක් බැගින් වන පරිදි වෙන් කර ඇති වාහන හැර අනෙකුත් සියළුම වාහන ඡන්ද විමසීමේ කටයුතු සඳහා**

ලබාදිය යුතු වාහන සේ සලකා කටයුතු කළ යුතු බවට අදාළ ආයතන ප්‍රධානින් දැනුවත් කිරීමට කරුණාකර කටයුතු කරන්න. එසේම පසුගිය ඡන්ද විමසීමට අදාළව සිදුකළ සංගණනය සඳහා යම් හේතුවක් මත යොමු නොකළ වාහන ඔබ සතුව තිබේනම් ඒ පිළිබඳව විස්තර ද, පසුගිය ඡන්ද විමසීමෙන් පසු දැඩි සේ අබලන්ව හෝ දරුණු අනතුරු වලට මුහුණ පෑ රථ තිබේනම් ඒ පිළිබඳ විස්තර ද මෙම චක්‍රලේඛය ලැබී දින හතක් ඇතුලත අදාළ තේරීම් භාර නිලධාරීන් / දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදීමට කටයුතු කළ යුතුය.

04. පසුගිය ඡන්ද විමසීම් වලින් පසු දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් විසින් මා වෙත එවා ඇති වාර්තාවන් අනුව පෙනීගිය එක් කරුණක් වනුයේ ඇතැම් ආයතන විසින් ලැයිස්තු ගත කර විස්තර ලබාදෙන ලද වාහන අතුරින් වාහන එකක් හෝ කීපයක් හෝ විවිධ හේතූන් ඉදිරිපත් කර අදාළ තේරීම් භාර නිලධාරී වෙත යැවීමට කටයුතු කර නොමැති බවය. මේ හේතුවෙන් දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් දැඩි අපහසුතාවයන්ට පත්වූ බවට මා වෙත වාර්තා කර ඇත. එබැවින් සෑම ආයතන ප්‍රධානියකු විසින්ම තමන් විසින් විස්තර ලබාදුන් වාහන සියල්ලම අදාල දිනයේ තේරීම්භාර නිලධාරීන් දැනුම් දුන් පරිදි යැවීමට වග බලා ගත යුතු බවට උපදෙස් දෙන්න. ඡන්ද විමසීම් කටයුතු සඳහා රාජ්‍ය ආයතන සතු වාහන ලබාදීම එම ආයතන ප්‍රධානීන් සතු වගකීමක් බව ජනාධිපති ලේකම්වරයා විසින් මටද පිටපතක් සහිතව අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් ප්‍රධාන ලේකම්වරුන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන් වෙත සීඑස්ඒ/10/08/11 හා 2009.02.17 දිනැති ලිපියෙන් උපදෙස් ලබාදී ඇති බවද සිහිපත් කරනු කැමැත්තෙමි.

05. සාමාන්‍යයෙන් ඡන්ද විමසීම පැවැත්වෙන දිනට කලින් සම්පූර්ණ දින තුනක කාල සීමාවක් සඳහා මෙම මෝටර් රථ වාහන අවශ්‍ය වන අතර ඡන්ද විමසීම පවතින දිනයට පසු දෙවැනි දිනයේ ඒවා ආපසු මුදා හරිනු ඇත.

06. තවද ඔබ විසින් විස්තර ඉදිරිපත් කර ඇති වාහන නැවත පරීක්ෂා කර බලා අවශ්‍ය වන්නේ නම් ඒවායෙහි කළ යුතු සුලු අළුත්වැඩියාවන් හෝ සේවා කිරීම් ඇත්තේ නම් ඒවා සිදු කොට ඡන්ද විමසීමේ රාජකාරී කටයුතු වල යෙදවීම සඳහා ඡන්ද විමසීමේ දිනයට යටත් පිරිසෙයින් සතියකට වත් පෙර සූදානම් කර තැබිය යුතුය.

07. දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් (දිස්ත්‍රික් ලේකම්වරුන්) වෙත වෙන්කර දෙනු ලබන වාහන සඳහා අවශ්‍ය ඉන්ධන ලිහිසි තෙල් ආදිය තේරීම් භාර නිලධාරීන් විසින් ඉන්ධන ඇණවුම් මගින් සැපයීමට කටයුතු සලස්වනවා ඇත. **වාහන අයත් ආයතනය අදාළ දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීගේ කාර්යාලයට වාර්තා කිරීමට යාමට පමණක් ප්‍රමාණවත් ඉන්ධන පමණක් ලබාදිය යුතුය. එම ඉන්ධන සඳහා වැය වූ මුදල මැතිවරණ වැය ශීර්ෂ යටතේ මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපූරණය කරනු ඇත.** ඉන්ධන ප්‍රතිපූරණය කිරීම, රියදුරන්ගේ අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම සහ ඡන්ද විමසීම් රාජකාරීවල නිරත කරවන කාර්ය මණ්ඩලයට ගෙවීම් කිරීම පිළිබඳ උපදෙස් ඇතුළත් චක්‍රලේඛයක් පසුව නිකුත් කරනු ඇත.

08. සියළුම රියදුරන්ට හා රිය ශෝධකයන්ට තැපැලෙන් ඡන්දය දීමේ පහසුකම් සලසා ගැනීමට හිමිකම් තිබේ. එබැවින් තම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ රියදුරන් හා රිය ශෝධකයින් මේ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කරන්න.

09. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 (ඊ) 1 ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

10. මෙම ඡන්ද විමසීම සාර්ථක කර ගැනීම සඳහා ඔබ සියළු දෙනාගෙන් ලැබෙන සහය බෙහෙවින් අගය කොට සලකමි.

**දයානන්ද දිශානායක,**
**මැතිවරණ කොමසාරිස්.**

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்


පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් தொலை நகல் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (தொலை நகல்) 2868450

මැතිවරණ මහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය: PE/10/24
எனது இல:
ඔබේ අංකය :
உமது இல:
දිනය : 2010.02.15

**ඉතා වැදගත්.**

**<u>චක්‍රලේඛ අංක TR/02(02)</u>**

**දිස්ත්‍රික් ලේකම් / තේරීම් භාර නිලධාරී,**

**නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස්,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010</u>**

**<u>රජයේ වාහන ලබාදීම.</u>**

ඉදිරියේදී පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේදී ප්‍රවාහන අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සැළකිය යුතු වාහන ප්‍රමාණයක් ඔබට අවශ්‍ය වනු ඇත. මේ සඳහා යොදා ගැනීම පිණිස ඔබ දිස්ත්‍රික්කයේ ඇති රාජ්‍ය ආයතන, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වලින් ලබාගත හැකි වාහන ප්‍රමාණය පිළිබඳ විස්තර ලබා ගැනීමට අදාළ වාහන සංගණනයක් පසුගිය ජනාධිපතිවරණයට අදාළව ඔබ විසින් සිදුකර ඇති නිසා නැවත සංගණනයක් කිරීම අවශ්‍ය නොවේ. කෙසේ වෙතත් මේ සමඟ යාකර ඇති TR/02 (01) චක්‍රලේඛය ඔබ දිස්ත්‍රික්කයේ අදාළ ප්‍රධානීන් වෙත යවා තම වාහන ඉදිරි ඡන්ද විමසීම සඳහා ලබාදීමට හැකිවන පරිදි සූදානම් කර තබන ලෙසට දන්වන්න.

02. මීට අමතරව තවදුරටත් ඔබ දිස්ත්‍රික්කයට අවශ්‍ය වාහන ප්‍රමාණය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ, පෞද්ගලික බස්රථ සහ කුලී පදනම මත ලබා ගන්නා වාහන යොදා ගත හැක. ඒ සඳහා වූ අනුමත ගාස්තු ඉදිරි දින කීපය තුළ ඔබ වෙත එවීමට කටයුතු කරන බවද කාරුණිකව දන්වමි. තවද ඔබ දිස්ත්‍රික්කයට ප්‍රමාණවත් රජයේ වාහන සංඛ්‍යාවක් තිබේනම් කුළී පදනම මත ද වාහන ලබාගෙන, රජයේ වාහන යම් ප්‍රමාණයක් වෙනත් දිස්ත්‍රික්ක සඳහා ලබාදීමට කටයුතු කරන ලෙසද කාරුණිකව දන්වමි.

03. මෙම ඡන්ද විමසීම සාර්ථක කර ගැනීම සඳහා ඔබ සියළු දෙනාගෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කොට සලකමි.

**දයානන්ද දිශානායක,**

මැතිවරණ කොමසාරිස්.

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்


පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් பெக்ஸ் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (பெக்ஸ்) 2868450

මැතිවරණ මහලේකම්කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය : PE/10/24
இல :
ඔබේ අංකය :
உமது இல :
දිනය :
திகதි : 2010.02.16

**චක්‍රලේඛ අංක -TR/02 (03)**

**සියළුම තේරීම් භාර නිලධාරී / දිස්ත්‍රික් ලේකම් ,**

**නියෝජ්‍ය /ජ්‍යෙෂ්ඨ සහකාර /සහකාර මැතිවරණ කොමසාරිස්,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010.</u>**

**<u>කුලී පදනම මත වාහන ලබා ගැනීම හා ගෙවීම් කිරීම.</u>**

ඉදිරියේදී පැවැත්වීමට නියමිත ඉහත සඳහන් ඡන්ද විමසීමේදී ඔබ දිස්ත්‍රික්කයේ ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා හැකි සෑම අවස්ථාවකදීම රජයේ වාහන යොදා ගනු ඇතැයි අපේක්ෂා කරමි.

02. ඡන්ද පොළවල් වෙත යවන කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීම සඳහා ද හැකිතාක් දුරට රජයේ වාහන යොදාගත යුතු අතර, ඡන්ද ස්ථානාධිපතීන් ඇතුළු නිලධාරීන් විසින් රැගෙන එන වාහන හා ගමනා ගමන මණ්ඩලයේ බස්රථද පෞද්ගලික බස් රථද එම කාර්යයට යොදා ගත හැක. **එහෙත් එම වාහන ද ප්‍රමාණවත් නොවන අවස්ථාවකදී ඡන්ද විමසීමේ කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීමට සහ කලාප තේරීම්භාර නිලධාරීන් සඳහා පමණක් කුලී ගෙවීම් පදනම මත ඔබගේ දිස්ත්‍රික්කය තුළින් පෞද්ගලික වාහන ලබා ගැනීම අනුමත කරමි.** මෙසේ ලබා ගන්නා වාහන පූර්ණ රක්ෂණය සහිත වාහන විය යුතු වුවද අවශ්‍යතාවය මත තුන්වන පාර්ශවයේ රක්ෂණයක් සහිත වාහන වුවද ලබාගත හැකිය.

03. එසේ ලබා ගන්නා වාහන වලට පහත සඳහන් උපරිමයකට යටත්ව ගාස්තු ගෙවිය හැකිය.

(I) **ධාවනය කරන දුර සඳහා ගාස්තුව කිලෝමීටරයක් සඳහා.**

| **වාහන වර්ගය** | **පෙට්‍රල් වාහන** | **ඩීසල් වාහන** |
|---|---|---|
| ආසන 08 ට අඩු | රු. 40.00 | රු. 34.00 |
| ආසන 08 -14 අතර | රු. 46.00 | රු. 39.00 |
| ආසන 15 -25 අතර | රු. 54.00 | රු. 45.00 |
| ආසන 26 -39 අතර | - | රු. 53.00 |
| ආසන 40 හෝ ඊට වැඩි | - | රු. 63.00 |

(II) **රඳවා ගැනීමේ ගාස්තු :-**

ඉහත 03. I ජේදයේ ගාස්තු වලට අමතරව තේරීම් භාර නිලධාරී වෙත වාර්තා කිරීමට උපදෙස් දුන් වේලාව හෝ එසේ වාර්තා කල වේලාව යන දෙකෙන් පසුව එළඹෙන වේලාවේ සිට තේරීම් භාර නිලධාරී විසින් වාහනය මුදාහල වේලාව දක්වා වු කාලයට පහත සඳහන් පරිදි රඳවා ගැනීමේ ගාස්තු ගෙවිය හැක.

| | |
|---|---|
| ආසන 08 ට අඩු වාහනය පැයට | රු. 15.00 |
| ආසන 08 හෝ වැඩි වාහන පැයට | රු. 25.00 |

04. තේරීම් භාර නිලධාරී විසින් කුලී පදනම මත සේවයේ යොදවා ගනු ලබන වාහන වලට එම වාහන තේරීම් භාර නිලධාරීන්ගේ කාර්යාලය වෙත ගෙන ඒම හා මුදා හැරීමෙන් පසු ආපසු රැගෙන යාම සඳහා ද පහත කොන්දේසි වලට යටත්ව සැතපුම් ගාස්තු ගෙවීම් අනුමත කරමි.

(I) වාහනය රැගෙන ඒමේදී හා රැගෙන යාමේදී දිස්ත්‍රික්කය ඇතුළත ධාවනය කිරීමට සිදුවන කිලෝ මීටර ගණන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කර තිබිය යුතුය.

(II) අදාළ දිස්ත්‍රික්කයෙන් පිට වාහන ලබා නොගත යුතුය.

05. කුලියට ගනු ලබන මෙම වාහන කුලියට ලබාගත් මුළු කාලය තුලදී යටත් පිරිසෙයින් කි.මී. 50 ක් හෝ ධාවනය නොවු අවස්ථාවක එම වාහන සඳහා කි.මී. 50 ක් සඳහා වු අවම ගාස්තුව ගෙවිය හැකිය. එහෙත් වාහනය රාජකාරියක නිරත කරවීමට අපේක්ෂා කළ අවස්ථාවක කාර්මික දෝෂයක් හෝ වෙනත් හේතුවක් නිසා ධාවනය කළ නොහැකි වී නම්, එම වාහන සඳහා කිසිදු ගාස්තුවක් නොගෙවිය යුතුය.

06. **ඡන්ද පොළ නිලධාරීන් ප්‍රවාහනය සහ කලාප තේරීම්භාර නිලධාරීන් සඳහා හැර සුභ සාධක කටයුතු ආදී වෙනත් අවශ්‍යතා සඳහා කුලී වාහන යොදා නොගත යුතුය.**

**07. ඉහත ගාස්තු ප්‍රමාණයන් යටතේ කුලී වාහන රැගෙන එන ලෙස ඡන්ද ස්ථානාධිපතින් ඇතුළු නිලධාරීන්ට උපදෙස් නොදිය යුතුය.** නිලධාරීන් රැගෙන එන වාහන සඳහා සැතපුම් කුලී ගෙවීම් කරනු ලබන්නේ ආයතන සංග්‍රහයේ දැක්වෙන විධිවිධාන හා ගෙවීම් සම්බන්ධ මාගේ චක්‍රලේඛයන්හි උපදෙස් අනුවය. ඊට අදාළ උපදෙස් පසුව නිකුත් කරනු ලැබේ.

**08.** කුලී වාහන ලබාගැනීම, ධාවනයේ යෙදවීම, හා ඒ සඳහා ගෙවීම් නිර්දේශ කිරීම වගකිව යුතු මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදුවිය යුතු අතර, එම නිලධාරී විසින් මෙම වාහන සම්බන්ධ පහත තොරතුරු ලේඛණයක සටහන් කරවීමට විධිවිධාන යෙදිය යුතුය.

(I) වාහනයේ අංකය.

(II) ඉන්ධන වර්ගය

(III) අයිතිකරුගේ නම සහ ලිපිනය

(IV) වාහනයේ ආසන ගණන

(V) ඡන්ද විමසීමේ කටයුතු සඳහා වාර්තා කළ දිනය හා වේලාව

(VI) මුදාහල දිනය හා වේලාව

(VII) ධාවනය කළ කිලෝමීටර් ගණන

(VIII) ධාවනය සඳහා ගෙවූ මුදල

(IX) රඳවා ගැනීම සඳහා ගෙවූ මුදල

(X) සේවයේ යෙදවීම අනුමත කල නිලධාරියාගේ නම

(XI) සේවයේ යෙදවීම අනුමත කල නිලධාරියාගේ නිල නාමය

(XII) සේවයේ යෙදවීම අනුමත කල නිලධාරියාගේ අත්සන

09. කුලී පදනම මත වාහන ලබාගන්නා අවස්ථාවේදීම ඒ සඳහා ගෙවනු ලබන ගාස්තු දැක්වෙන ලිපියක් වාහන හිමියන්ට නිකුත් කළ යුතුය. තවද වාහනය ධාවනය කිරීමට නියෝග දෙන නිලධාරියාගේ නම, නිල නාමය හා රාජකාරී ලිපිනයද ගෙවීම් කිරීම සඳහා බිල්පත් ඉදිරිපත් කළ යුතු නිලධාරියාගේ නිල නාමය හා රාජකාරී ලිපිනය ආදී විස්තර ද එම ලිපියේ අඩංගු විය යුතුය.

10. ඡන්ද විමසීම අවසන්ව මාසයක් ඇතුලත මෙම කුලී වාහනවලට ගෙවීම් අවසන් කළ යුතුය. එසේ ගෙවීම් කළ වහාම ඉහත 08 වන ඡේදයේ සඳහන් ලේඛනය නියෝජ්‍ය /ජ්‍යෙෂ්ඨ /සහකාර මැතිවරණ කොමසාරිස් බාරයට ගත යුතුය.

11. ඡන්ද විමසීමේ අවශ්‍යතා සඳහා යෙදවීම පිණිස තේරීම් භාර නිලධාරී / නියෝජ්‍ය /ජ්‍යෙෂ්ඨ/ සහකාර මැතිවරණ කොමසාරිස් විසින් කුලී පදනම මත ලබා ගන්නා වාහනවලට ගෙවීම් කිරීම නියෝජ්‍ය /ජ්‍යෙෂ්ඨ /සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින්ම කළ යුතුය. එම ගෙවීම වෙනත් කාර්යාල මඟින් කර ප්‍රතිපූරණය සඳහා මැතිවරණ කොමසාරිස් වෙත හෝ නියෝජ්‍ය /ජ්‍යෙෂ්ඨ/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත ඉදිරිපත් නොකරන ලෙසට උපදෙස් දිය යුතුය.

12. තැපැල් , පොලිස් යන දෙපාර්තමේන්තුවල සහ ආරක්ෂක හමුදාවල අවශ්‍යතාවයන් සඳහා කුලියට ගනු ලබන වාහනවලට ගෙවීම් මැතිවරණ කොමසාරිස් හෝ නියෝජ්‍ය /ජ්‍යෙෂ්ඨ/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් සිදු කරනු නොලැබේ. මීට අදාළ උපදෙස් පසුව නිකුත් කරනු ලැබේ.

**දයානන්ද දිසානායක,**

**මැතිවරණ කොමසාරිස්.**

**පිටපත් :** 1. පොලිස්පති - ඔබ දෙපාර්තමේන්තුවේ මැතිවරණ කටයුතු සඳහා අවශ්‍යවන වාහන ඉහත ගාස්තු යටතේ ලබා ගත හැක.

2. විගණකාධිපති
3. සහකාර තේරීම් භාර නිලධාරී - ප්‍රවාහන
4. ගණකාධිකාරී (මුදල්)
5. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන)

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்


පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් பெக்ஸ் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (பெக்ஸ்) 2868450

මැතිවරණ මහලේකම්කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය : PE/10/24
இல :
ඔබේ අංකය :
உமது இல :
දිනය :
திகதி : 2010.02.17

**ඉතා වැදගත් / හදිසියි.**

**චක්‍රලේඛ අංක -TR/02 (04 )**

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරු,**

**දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010.</u>**

**<u>ඡන්ද විමසීමේ කටයුතු සඳහා රජයේ වාහන ලබාදීම.</u>**

පසුගිය ජනාධිපතිවරණ ඡන්ද විමසීමේදී දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන්ගේ අවශ්‍යතාවය සඳහා කොළඹ සංචිතයෙන් වාහන ලබාදීම පිණිස ඔබ ආයතනය සතු වාහන පිළිබඳ තොරතුරු ලබාදීමෙන් හා එම වාහන නියමිත දින නියමිත වේලාවට දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදීමෙන් දෙන ලද සහයෝගයට ඔබට බෙහෙවින් කෘතඥ වෙමි.

02. ඉදිරියේදී පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේදී බොහෝ දිස්ත්‍රික්කයන්හි තේරීම් භාර නිලධාරීන්ට ඡන්ද විමසීමේ කටයුතු සිදුකරලීම පිණිස අවශ්‍ය ප්‍රවාහන කටයුතු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි වාහන තම දිස්ත්‍රික්කය තුළින් සපයා ගැනීමට අපහසු වනු ඇත. එබැවින් මීට පෙර පැවති ඡන්ද විමසීම් වලදී මෙන් ඉදිරියේදී පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේදී එම දිස්ත්‍රික්ක සඳහා කොළඹ සංචිතයෙන් වාහන ලබාදීමට කටයුතු කළ යුතුව ඇත.

03. මේ සඳහා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සතු වාහන පිළිබඳ නැවත සමීක්ෂණයක් නොපවත්වා ජනාධිපතිවරණ ඡන්ද විමසීමේදී උක්ත ආයතන වලින් ලබාගත් වාහන තොරතුරු පදනම් කරගනිමින් ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණයේදී ද ඔවුනට අවශ්‍ය වාහන කොළඹ සංචිතයෙන් ලබාදීමට මවිසින් බලාපොරොත්තු වනු ලැබේ. එබැවින් මේ සමඟ අමුණා ඇති ඔබ ආයතනයට අයත් වාහන

ලැයිස්තුවේ ඇතුලත් වාහන අතරින් **හදිසි අනතුරු වලට ලක්වීම හෝ ඉතා විශාල අළුත්වැඩියා වලට ලක්කළ යුතුව ඇති වාහන ඇත්තේ නම් පමණක් ඒවා මෙම ලිපිය ලැබී දින හතක් ඇතුළත මේ සමඟ ඇති V-4 ආකෘතිය මඟින් විස්තර සඳහන් කර මා වෙත එවන ලෙස ඔබට කාරුණිකව දන්වමි.**

04. තවද පසුගිය වාහන සමීක්ෂණයේදී ඇතැම් ආයතන ප්‍රධානීන් මා විසින් නිකුත් කරන ලද උපදෙස් පරිදි වෙන් කළ වාහන හිමි නිලධාරීන් සතු වාහන හැර අනිකුත් සියළුම වාහන පිළිබඳ තොරතුරු එම ආකෘතියට ඇතුලත් කර නොමැති බවට මා වෙත වාර්තා වී ඇත. රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි මේ තත්වය බොහෝ දුරට පැවති බවට මා වෙත වාර්තා වී ඇත. ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණය සඳහා යොදා ගැනීම පිණිස එසේ ඇතුලත් නොකළ වාහන ඇත්තේ නම් ඒවා සියල්ලම මේ සමඟ ඇති V-5 ආකෘතියට ඇතුලත් කර මා වෙත එවන ලෙස ඔබට කාරුණිකව දන්වමි.

05. රාජ්‍ය ආයතන, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සතු වාහන විශාල ප්‍රමාණයක් ඇති බවට තොරතුරු ලබාගෙන ඇති හෙයින් එම සියළු වාහන මෙම කාර්යය සඳහා ලබාදීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අදාළ බලධාරීන් කටයුතු කරනු ඇතැයි උදක් බලාපොරොත්තු වන බව මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි.

06. මෙම කාර්ය සාර්ථක කර ගැනීම සඳහා ඔබ සියළු දෙනාගේම සහාය අපේක්ෂා කරන අතර, ඒ මත කටයුතු කිරීමෙන් දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන්ට අවශ්‍ය වාහන සංඛ්‍යාවෙන් වැඩි ප්‍රමාණයක් රාජ්‍ය ආයතන, සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන මඟින් ලබාදීමට හැකිවෙතැයි මම විශ්වාස කරමි. මේ නිසා කුලී පදනම මත සුළු වාහන ප්‍රමාණයක් පමණක් දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන්ට ලබා ගැනීමට සිදුවන හෙයින්, ප්‍රවාහන කාර්යය සඳහා වැය කරනු ලබන අති විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට ද හැකිවනු ඇත.

07. ඉදිරියේදී පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණය සාර්ථක කර ගැනීම සඳහා ඔබ සියළු දෙනාගෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කොට සළකමි.

**දයානන්ද දිසානායක,**

මැතිවරණ කොමසාරිස්.